## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - 2014

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 25 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිති අංක 01 ට අනුව කවර ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් භාවිතා කළද වාර්තා කරන දිනයේ සිට මාස 12 ට පෙර හා මාස 12 ට පසු අයකරගැනීමට බලාපොරොත්තුවන වත්කම් ද්‍රවශීලතාවය අනුව මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිති අංක 02 ට පටහැනිව ආයෝජන ක්‍රියාකාරකමක් වූ ආයෝජන ආදායම් ලැබීම් රු. 750,148 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ආදායම් ලෙස සලකා තිබුණි.

(ඇ) ප්‍රමිති අංක 07 ට අනුව දේපල ,පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් ප්‍රමාණාත්මකව වෙනස් වන විට වාර්ෂිකව ප්‍රත්‍යාගණනයන් සිදුකිරීම සහ ප්‍රමාණාත්මක නොවන වෙනස්කම් සහිත දේපල , පිරියත හා උපකරණ සඳහා වසර 3 කට හෝ වසර 5 ට වරක් ප්‍රත්‍යාගණනය සිදුකළ යුතු වුවත් අධිකාරිය 1999 වර්ෂයේදී ස්ථාපිත කිරීමෙන් පසුව පළමු වරට 2012 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රත්‍යාගණන ගැලපීම් සිදු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමේදී පිරිවැය ක්‍රමය හෝ ප්‍රත්‍යාගණිත ක්‍රමය යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් පමණක් අනුගමනය කළයුතු වුවත් අධිකාරිය විසින් ඉඩම් වලින් කොටසක් ප්‍රත්‍යාගණිත ක්‍රමයටද ඉතිරි කොටස පිරිවැය ක්‍රමයටද ගිණුම්ගත කර තිබුණි.

(ආ) නිශ්චිත ගිණුම් කටයුත්තක් වෙනුවෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතාකරන ලද ගිණුම්කරණ ක්‍රමයෙන් ආවරණය නොවන්නේ නම් එහිදී වඩාත්ම යෝග්‍ය ආකාරයට ( Best Practice) අනුව කටයුතු කළ යුතු අතර ඒ බව සඳහන් කර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළියෙල කර එය අනුගමනය කළ යුතු වුවත්, අධිකාරිය විසින් ජීව විද්‍යාත්මක වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේදී වෙළඳ හා අනෙකුත් ලැබීම් වැඩිවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව රු.965,536 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වල එය රු.2,023,278 ක් ලෙස ගැලපුම් කර තිබීම හේතුවෙන් රු.1,057,742 කින් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා දරන ලද මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම්හි සමාලෝචිත වර්ෂයට අදාල වන ජංගම වත්කම් හා ජංගම බැරකම්වල විචලනයන් පමණක් ගැලපිය යුතු වුවද , අධිකාරිය විසින් ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති වටිනාකම රු.9,633,616 ක් වූ කොන්ත්‍රාත් මත රඳවාගැනීම් ශේෂයන්හි වෙනස්වීමද කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට ගැලපුම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු ඇස්තමේන්තු කර ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු වැටුප් හා වේතන රු.123,852 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් විලම්භිත ආදායම් රු.121,414 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපුම් කර තිබුණි.

(ඊ) පෙර වර්ෂයට අදාල ක්ෂය ගැලපීම් රු.3,923,420 ක් අතීතානුයෝගීව ගැලපීම් කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) වසර 5 ට වඩා වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවති රු.43,678,802 ක් වටිනා හඳුනානොගත් නොනිමි වැඩ ප්‍රවර්තන වර්ෂයේදී වත්කම්වලට ගැලපුම් කර තිබූ අතර, ඒ සඳහා වූ වාර්ෂික ක්ෂය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපුම්කර නොතිබුණි.

(ඌ) අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබුණු අම්පාර, බිංගිරිය, මාපාකඩවැව හා ඉරණවිල යන මධ්‍යස්ථානවල පිහිටි ඉඩම් හෙක්ටයාර 6.9 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී විකුණා තිබුණු මෝටර් බයිසිකල් 5 ක පිරිවැය හා ඊට අදාල ක්ෂය හඳුනාගෙන ගිණුම්වලට ගැලපුම් කර නොතිබුණු අතර අලෙවියෙන් ලද රු.133,758 ක් වූ මුළු මුදලම ලාභයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගලපා තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොළොන්නරුව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයෙන් වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට ලැබීමට ඇති බදු කුලී ආදායම වූ රු.1,612,285 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මත්ස්‍ය පැටවුන් විකිණීමෙන් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට රාජ්‍ය ආයතන හා පෞද්ගලික පොකුණු හිමියන්ගෙන් ලැබීමට ඇති ණය ශේෂය රු.1,120,699 ක් වූ අතර වර්ෂයකට වැඩි වර්ෂ 4 දක්වා කාලයකට අදාල ලැබිය යුතු ණය ශේෂය රු.6,188,895 ක් විය. අධිකාරිය මෙම ණය මුදල් අයකරගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 2 ත් 3 ත් අතර කාලයක සිට පැවත එන එකතුව රු.7,283,242 ක් වූ ගිණුම් විෂයයන් පහක් නිරවුල් කිරීමකින් තොරව ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv වැනි පරිච්ඡේදයේ 9.6 වගන්තිය | උණුසුම් ඇඳුම් මිලදීගැනීම සඳහා නිලධාරීන් හත්දෙනෙකු වෙත ලබා දී තිබූ රු.112,656 ක අත්තිකාරම් වෙනුවෙන් කිසිදු නිලධාරියෙකු විසින් අදාල මුදලින් උණුසුම් ඇඳුම් මිලදී ගත් බවට සනාථකිරීම සඳහා බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371(2) | දෙන ලද අත්තිකාරම් මුදල් අදාල කාර්යය නිමකළ වහාම නිරවුල් කළ යුතු වුවද අධිකාරියේ නිලධාරීන් හා විවිධ ආයතන වෙත සමාලෝචිත වර්ෂයේදී දෙන ලද රු.2,708,846 ක අත්තිකාරම් නිරවුල් කිරීමට මාස 2 සිට මාස 9 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 137 හා 138 | වටිනාකම රු. 270,000 ක් වූ අනුමත නොකළ ගෙවීම් වවුචර් 6 ක් සඳහා හා වටිනාකම රු. 321,196 ක් වූ සහතික නොකළ ගෙවීම් වවුචර 12 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| (ඇ) | 2009 ජූනි 01 දිනැති අංක ඩීඑම්එස්/ඒ/08/21 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 30(1) | සේවක වැටුප් සංශෝධනය කර හා ප්‍රතිකාණ්ඩගත කර නව කාණ්ඩය යටතේ නිලධාරීන් වැටුප් පියවරයන්හි පිහිටුවීමේදී, එවකට සේවයේ නිරතව සිටි නිලධාරීන්ගෙන් 05 දෙනෙකු සඳහා එක් අයෙකුට වැටුප් වර්ධක 09 ක් බැගින් වැඩියෙන් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.26,327,842 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,111,373 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රු.17,216,469 ක පිරිහීමක් පෙන්නුම් කළ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 189 ක් විය. මුද්‍රණ වියදම්, විද්‍යාගාර උපකරණ මිලට ගැනීම්, පාරිතෝෂික වෙන්කිරීම්, අඩමාණ ණය හා සංග්‍රහ වියදම් වැඩිවීම මීට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ගිණුම් විෂයයන් 13 ක වියදම් සියයට 21 සිට සියයට 1052 ක් දක්වා වැඩි වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

අධිකාරියේ වාර්තා අනුව පසුගිය වර්ෂ 05 ක කාලය තුල මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය පහත පරිදි විය.

| වර්ෂය | කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය |
|---|---|---|
| | මෙ.ටොන් | මෙ.ටොන් |
| 2010 | 330,240 | 51,390 |
| 2011 | 381,260 | 59,560 |
| 2012 | 417,220 | 68,950 |
| 2013 | 445,930 | 66,910 |
| 2014 | 459,300 | 75,750 |

2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය පිළිවෙලින් සියයට 3 කින් හා සියයට 13 කින් වැඩිවී තිබුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

2014 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 551 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 440 ක් විය.ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 111 ක් වූ අතර මෙම තනතුරු පිරවීමට අධිකාරිය විසින් 2015 ජුනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර විෂයයන් 26 ක සියයට 17 සිට සියයට 1054 දක්වා සැලකිය යුතු විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයන් ලෙස යොදවා ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් පාලනය
(ඇ) අත්තිකාරම් ගෙවීම්
(ඈ) ඉඩම් බදුදීම